www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සසප/සසජාශි මැයි දින රැස්වීම කොළඹ දී

## SEP/ISSE May Day meeting in Colombo

**2008 අප්‍රේල් 28**

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) සංවිධානය මැයි 1 දා කොළඹ දී මැයි දින රැස්වීමක් පවත්වනු ඇත.

ලොව වටා කම්කරුවන් හා තරුන ජනයා මුහුන දී සිටින්නේ යුද්ධයේ වැඩෙන තර්ජනයට සහ ඔවුන්ගේ ජීවන මට්ටම් හා මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් මත එල්ල කෙරෙන තීව්‍ර කෙරුනු ප්‍රහාර මාලාවකට ය.

ඉරාකයේ හා ඇෆ්ඝනිස්ථානයේ දී එය ලද පසුබෑසීම් තිබිය දී ම, බුෂ් පාලනාධිකාරිය ඉරානයට එරෙහි මිලිටරි ප්‍රහාරයක් සඳහා වූ සිය ප්‍රකෝපකාරී සූදානම උත්සන්න කරමින් සිටී. එවන් ප්‍රහාරයක් කලාපය පුරා හා ජාත්‍යන්තරව ආතතීන් නාටකාකාර ලෙස තීව්‍ර කොට වඩා පුලුල් යුද ගැටුමක තර්ජනය මතු කරයි.

මිලිටරිවාදයේ මෙම පිපිරීමෙහි ගාමක බලය වන්නේ, අවමුඛ උගස්කර වෙලඳ පොලේ අර්බුදය හා ගැඹුරු වන ගෝලීය මූල්‍ය අර්බුදය මගින් විචිත්‍ර ලෙස ප්‍රකාශයට පත්ව ඇති එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ලෝක තත්වයේ ඓතිහාසික කඩාවැටීම යි. ලොව වටා කෝටි සංඛ්‍යාත ජනයාට දැරිය නොහැකි මට්ටමකට ආහාර මිල ගනන් ඉහල නැගීමට තුඩු දී ඇති සමපේක්ෂන රැල්ල තුල ධනපති වෙලඳ පොලේ අරාජක ස්වභාවය එලිදරව් කෙරෙමින් පවතී.

ශ්‍රී ලංකාව මෙම ගෝලීය ප්‍රවනතාවල තියුනු ප්‍රකාශනයකි. දශ ලක්ෂ සංඛ්‍යාත ජනයා මුහුන දෙන සමාජ අර්බුදය විසඳලීමට අපොහොසත්ව ඇති ආන්ඩුව වර්ගෝත්තමවාදී වෛරය හිතාමතාම අවුලුවා දිවයින යලි යුද්ධය කරා තල්ලු කර තිබේ. යුද්ධයට හා එහි දැවැන්ත ආර්ථික බරට එරෙහිව නැගෙන විරුද්ධත්වයට ප්‍රතිචාර වසයෙන්, ජනාධිපති මහින්ද රාජපක්ෂ වාරනයේ, අත්තනෝමතිකව අත් අඩංගුවට ගෙන රඳවා ගැනීමේ හා රාජ්‍ය ත්‍රස්තයේ පිහිට පතමින් සිටී.

යුද්ධයේ, දරිද්‍රතාවයේ, ලෙඩ රෝගවල හා සාගින්නේ වද වේදනාවලට පවත්නා එකම විසඳුම වන්නේ යල් පිනූ ලාභ ගරන ක්‍රමයත් එමගින් ලෝකය එකිනෙකා සමග තරග වදින ජාතික රාජ්‍යවලට බෙදී පැවතීමත් අහෝසි කිරීම යි. පොදු සමාජවාදී ඉදරිදර්ශනයක් මත ලොව වටා කම්කරු පන්තිය ඒකාබද්ධ කිරීම අද හදිසි ප්‍රයෝගික අවශ්‍යතාවක් බවට පත්ව ඇත. මෙම දැවෙන ප්‍රශ්න සාකච්ඡා කරනු වස් මෙවර මැයි දිනයේ දී අප හා එක් වන ලෙස සසජාශි සහ සසප කම්කරුවන්ට, තරුන ජනයාට හා බුද්ධිමතුන්ට ආරාධනා කර සිටිමු.

**දිනය හා වේලාව: මැයි 1 දා සවස 3**

**ස්ථානය: නව නගර ශාලාව, ග්‍රීන් පාත්, කොළඹ 7**

**ප්‍රධාන කතිකයා: විජේ ඩයස්, සසප ප්‍රධාන ලේකම් සහ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජික.**

© www.wsws.org